# විසංවාද

# වැරැද්දක් තියෙනවා නම් අපෙන් අහන්න

## ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න

**තොරතුරු හා ප්‍රජාතන්ත්‍රවාදය අතර තියෙන්නේ ලොකු සම්බන්ධයක්. මේ ගැන කතා කරලා අපි සාකච්ඡාව පටන් ගත්තොත්?**

රටේ මොනවාහරි සිද්ධවෙන දෙයක්, සංවර්ධනය හා අනෙකුත් සමාජ ආර්ථික තත්ත්වයන් පවතින්නේ වෙනස් වෙන්නේ කොහොමද කියන එක අපිට තහවුරු කරන්නේ දත්ත. දත්ත නොමැතිව අපිට යමක් ප්‍රකාශ කරන්න බැහැ. ප්‍රකාශයක් කළත් ඒ ප්‍රකාශයට වලංගුභාවයක් එන්න නම් ඒක දත්ත මඟින් තහවුරු වෙන්න ඕනේ. අපි කියනවා නම් ලංකාවේ ආර්ථිකය දැන් වර්ධනය වෙමින් පවතිනවා කියලා ඒකට අපිට දත්තයක් ඕනේ. දත්ත මඟින් ආර්ථික වර්ධන වේගය සකස් කරන්නෙ නැත්නම් ඒ දේ තහවුරු කරන්න බෑ. අපි හිතමු අවුරුදු දහය තුළ උපත් අඩු වෙමින් පවතිනවා කියලා. අපිට ඒක තහවුරු කරන්න නම් දත්ත ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය තුළ රටේ මහජනතාව රටේ පවතින තත්ත්වය දැනගන්න ඕනේ. එයාගේ සාමාන්‍ය අවශ්‍යතා වගේම රටේ කොහොමද සමාජ ආර්ථික කටයුතු සිදුවෙන්නේ කියන දේ දැන ගැනීම ප්‍රජාතන්ත්‍රවාදයේම අංගයක්. එතකොට ඒ සඳහා දත්ත කියන දේ තමයි ප්‍රධානතම කාර්යභාරයක් ඉෂ්ට කරන්නේ.

**ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව අනිකුත් රාජ්‍ය ආයතන සමඟ ඇති ගනුදෙනුව මොන වගේද?**

අපේ දෙපාර්තමේන්තුව කියන්නේ ශ්‍රී ලංකාවේ තියෙන නිල සංඛ්‍යා සපයන ආයතනය. ඒ අනුව අපේ කොළඹ තියෙන ප්‍රධාන කාර්යාලයට අමතරව අපි දිස්ත්‍රික් කාර්යාල පිහිටුවලා තිබෙනවා වගේම ප්‍රධාන අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවලත් අපේ නිලධාරීන් අනුයුක්ත කරලා ඉන්නවා. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අපේ දෙපාර්තමේන්තුවේ අංශයක් පිහිටුවලා තියෙනවා. එතැන අංශ ප්‍රධානියෙක්, නියෝජ්‍ය අධ්‍යක්ෂ කෙනෙක්, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යා ලේඛනඥයෙක් ඉන්නවා. ලංකාවේ තියෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 340ටම අපේ නිලධාරියෙක් අනුයුක්ත කරලා තියෙනවා. අපි සමීක්ෂණයක් පවත්වන අවස්ථාවන්වලදී තොරතුරු රැස්කිරීම් සිදු කරන්නේ ඒ අනුයුක්ත කරලා සිටින නිලධාරීන්.

**සංගණන ක්‍රියාවලියක් සිදුවන්නේ කොහොමද?**


සංගණනයකදී ක්‍රමවේදය වෙනස්. මොකද සංගණනයක් කියන්නේ ශ්‍රී ලංකාවේ ජීවත්වන පුද්ගලයන් මිලියන 22ක තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලියක්. ඒ ක්‍රියාවලියේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 340ක ඉන්න නිලධාරීන්ට ඒක ආවරණය කරන්න අපහසුයි. සංගණන පවත්වන්නේ සංගණන ආඥා පනත යටතේ. එහිදී දිස්ත්‍රික් ලේකම්තුමා සංගණන කොමසාරිස් විදිහට, ප්‍රාදේශීය ලේකම්වරු නියෝජ්‍ය සංගණන කොමසාරිස්වරු විදිහට පත්වෙනවා. අපේ දෙපාර්තමේන්තුව සංගණනයට තාක්ෂණ කටයුතු කරන අතරේ ප්‍රාදේශීය ලේකම්වරු ඒකේ පරිපාලන කටයුතු මෙහෙයවනවා. එතකොට අපිට ප්‍රාදේශීය පරිපාලනයේ සහයෝගය මේ තොරතුරු රැස් කිරීමට අත්‍යවශ්‍ය වෙනවා.

**දත්ත රැස් කිරීමේදී ඔබ දෙපාර්තමේන්තුව මුහුණදෙන අභියෝග මොනවාද? ඒ අභියෝග කාලය අනුව දැන් වෙනස් වෙලාද?**

අපි බොහෝ ගැටලුවලට මුහුණදුන්නා. ගණන් ගැනීමේ නිලධාරීන් බඳවා ගැනීමේදී ඇත්තටම ඒ ගැටලුව ආවේ ගොඩක්ම නාගරික ප්‍රදේශවල. දෙපාර්තුමේන්තුවේ ටැබ්ලට් පරිගණක ගණනාවක් තිබුණ නිසා අපිට රජයේ සේවකයන්

ඇතැම් අවස්ථාවන්වල ඒ ගෙදරට තොරතුරු රැස්කර ගන්න වෙලාවක් හොයාගන්න අපහසු වෙනවා. එතකොට අපිට වෙනම කණ්ඩායම් වශයෙන් රාත්‍රී කාලයේ ගිහිල්ලා තොරතුරු රැස් කරන්න සිද්ධ වුණා. ඒ වගේ ගැටලුත් එක්ක තමයි අපිට මේ කොළඹ, ගම්පහ අධික නාගරික ප්‍රදේශවල වැඩ කරන්න වුණේ. කොච්චර කොම්පියුටර්, ෆෝන් එක පුළුවන් වුණත් අනේ වෙලාවක් නෑ කියනවා. ඒක හැඟීමනේ. උදාහරණයකට වෙන රටක් ගත්තොත් ෆෝන් එක ආන්සර් නැත්නම් දඬුවම් ලැබිය හැකි වරදක්. ඒක අනිවාර්යයෙන්ම කරන්න ඕනේ. නැත්නම් දඩයකට යටත් වෙනවා.

**සමීක්ෂණවලදී නිවැරදි දත්ත ලබා නොදීම එක්තරා ප්‍රශ්නයක්. උදාහරණයකට අස්වැසුම ගන්න බොරු කියන්න පුළුවන්. ඒ වගේ වෙලාවක සමීක්ෂණයක ප්‍රතිඵලදායක බව අභියෝගයට ලක්වෙනවා නේද?**



සංගණන ආඥා පනත යටතේ තොරතුරු දෙන්න හැම කෙනෙක්ම බැඳිලා ඉන්නවා. බොහෝ වෙලාවට අපි විශ්වාසය ඇති කරගෙන තොරතුරු ගන්නවා. මහජනතාවට ස්තුතිවන්ත වෙන්න ඕනේ. බොහොම සුළු ප්‍රතිශතයක් තමයි ප්‍රතික්ෂේප කිරීම් වෙන්නේ. බොහෝ පිරිසක් අවබෝධයෙන් තොරතුරු ලබා දෙනවා. 1901 කියලා අපි අංකයක් හඳුන්වා දීලා තියෙනවා. අපි එහෙම දඩ ගහලා නෑ. නමුත් නීතිය තියෙනවා. එහෙම නොවුණොත් අපිට නඩු දාන්නත් පුළුවන්. පෞද්ගලික මට්ටමේ සේවා, ප්‍රතිලාභ ලබාදීමේ අරමුණු ඇතිව සිදුකරන තොරතුරු රැස් කිරීමක් සහ සංගණනයක් අතර සංකල්පමය ලොකු වෙනසක් තියෙනවා. ප්‍රශ්නාවලිය හැදිලා තියෙන්නෙම පුද්ගලයකුට අසත්‍ය තොරතුරු දීමට නොහැකි වන විදිහටමයි. උදාහරණයකට වයස එකක් කියලා අධ්‍යාපන මට්ටම වෙන එකක් කිව්වොත් අපේ පරීක්ෂාවලටත් ලක්වෙනවා. අස්වැසුම වගේ දීමනාවකට බලපාන විධියේ ප්‍රශ්න අපේ සංගණනයකදී අපි අහන්නේ නෑ. ගෙදර තියෙන භාණ්ඩ, ටී.වී., රේඩියෝ ගැන අපි අහන්නේ යම් යම් දර්ශකයන් හදනවා රටක තියෙන මට්ටම දැනගන්න. ආදායම්-වියදම් වගේ තොරතුරු අපි මේ සංගණනයේදී අහන්නේ නෑ. අපේ පරිගණක වැඩසටහන් හදලා තියෙන්නෙම නොගැළපීම් තියෙනව නම් ප්‍රශ්නෙට උත්තර දෙනකොටම ඒක අහුවෙන විදිහටයි. සංගණන නිලධාරියෙක් ඒ අදාළ ස්ථානයට යන නිසා නිරීක්ෂණයෙන්ම ලබාගන්න තොරතුරු නිසා කෙනකුට වංචාවක් බොරුවක් කරන්න බැහැ. දත්ත පද්ධතිය විශ්ලේෂණ මට්ටමට සකස් කළාට පස්සේ පුද්ගල නාමය පවා අපිට වැදගත් නැහැ. පුද්ගල නාමය අපි භාවිත කරන්නේ තොරතුරු එකතු කරනකොට. දත්ත පද්ධතියක් වෙනකොට ඒ නම නැහැ. විශ්ලේෂණයේදී ඒ නම් අයින් වෙලා තමයි දත්ත පද්ධතිය එන්නේ. අංකයක් විතරයි තියෙන්නේ.

**අසත්‍ය තොරතුරක් දුන්නොත් ඒක දත්ත පද්ධතියට බලපානවනේ?**

සංගණනයට යොමුවන සෑම නිලධාරියෙක්ම පුහුණු කරපු නිලධාරීන්. මෙන්න මෙහෙමයි මේ තොරතුරු ලබා දෙන්නේ, මෙහෙමයි ප්‍රශ්නය අහන්න ඕනේ කියලා සති දෙක තුනක ඉතාමත් විධිමත් පුහුණුවක් ලබා දෙනවා. 100% පුහුණු කරද්දී 10% විතර සංකලනයක් පවත්වද්දී නොනියැළුම් දෝෂ කියලා අපි කියනවා. ප්‍රතිචාරකයා වැරැදි තොරතුරුත් දෙන්න පුළුවන්. ගණන් ගන්නා නිලධාරියා ප්‍රශ්න අහන විදිහට වැරැදි තොරතුරක් එන්නත් පුළුවන්. ඒවා නැත්තට නැති කරන්න බැහැ. ප්‍රතිචාරකයාට බොහෝ වෙලාවට තීරණය කරන්න බෑ. අපි ප්‍රශ්න අහන විදිහට මේ ප්‍රශ්නය හරහා මොනවගේ දෙයක් අපි ලකුණු කරනවද කියලා. උදාහරණයකට ගත්තොත් රටේ ඉන්න ආබාධිත ජනගහනය තීරණය කරද්දී අපි ප්‍රශ්න අහන්නේ අපහසුතා ගැනයි.

**මාසික වියදම සකසන භාණ්ඩ පැස ගැන විවේචන ආවා. පසුගිය කාලයේ මිනිස්සු පාවිච්චි කරන දේවල් නෙවෙයි මේ පැසේ තියෙන්නේ කියලා. ඒ චෝදනාව පිළිගන්නවාද?**

අපි දැනට භාවිත දරිද්‍රතා රේඛාව හදලා තියෙන්නේ 2019 වර්ෂයේදී පැවැත්වුණු ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය පදනම් කරගෙනයි. අපි හිතනවා අද වෙනකොට අපේ රටේ පහුගිය කාලේ සිදුවුණු ආර්ථික අර්බුදයත් එක්ක මිනිසුන්ගේ ජීවන රටාව යම් ප්‍රමාණයකට වෙනස් වෙන්න ඇති. පාරිභෝගික ද්‍රව්‍ය, ආහාර පාන යම් ප්‍රමාණයකට වෙනස් වුණා කියන පදනම උඩ තමයි මේ චෝදනාව කරන්නේ. එහෙම නැත්නම් ඒ භාවිත නොකරන භාණ්ඩ අරගන්නෑ. මොකද මහජනතාව දෙන තොරතුරු පදනම් කරගෙනම තමයි අපි ඒ භාණ්ඩ ලැයිස්තුව හදන්නේ. ඔබ කියනවනම් මම මෙන්න මේ භාණ්ඩ තමයි පාවිච්චි කරන්නේ කියලා. ඒකෙ වැඩි දෙනෙක් භාවිත කරන භාණ්ඩ පැසනෙ අපි ඒකෙදි භාවිත කරන්නේ. දර්ශක සකස් කරනකොට. එතකොට ඒක වැරැදියි කියන එක නෙවෙයි. ඒ භාණ්ඩ පැස දැනට තියෙන තත්ත්වයට ගැළපෙන්නේ නැහැ කියන එක තමයි කියන්නේ. 2019 තිබුණු තත්ත්වය අද වෙනකොට වෙනස් වෙලා. අපේ රටේ තිබුණු කොවිඩ් වසංගතය, ආර්ථික අර්බුදයත් එක්ක මිනිසුන්ගේ ජීවන රටාව වෙනස්වීම තමයි ඒ පැසට බලපාලා තියෙන්නේ. එතකොට සමහර භාණ්ඩ ඉවත් වෙලා වෙන භාණ්ඩ එතැනට ඇවිල්ලා ඇති. ඒක තමයි කියන්නෙ. ඒක ඇත්තටම වැරදියි කියනවටත් වඩා ඒක කාලයත් එක්ක වුණ වෙනස්කම. ඒකට අනුගත කරන්න බැරි ගැටලුව තමයි තියෙන්නේ.

**රජයේ බොහෝ දත්තවලට ප්‍රවේශ වීමට මහජනතාවට බෑ. ඒක ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයක් නොවෙයි කියලා ලර්න් ඒෂියා ආයතනය පවසා තිබුණා. මේ ගැන මොකද හිතන්නේ?**

අපේ දෙපාර්තමේන්තුවේ නිකුත් කරන සියලුම වාර්තා අපේ වෙබ් අඩවියට ඇතුළත් කරලා තියෙනවා. අපි මොන වාර්තාවක් නිකුත් කළත් සියලු දේ වෙබ් අඩවියට ඇතුළත් කරලා තියෙනවා. අපිට තියෙනවා දත්ත නිකුත් කිරීමේ ක්‍රමවේදයක්. එන්න එන්නම අපිට දත්ත ඉල්ලීම් වැඩි වෙනවා. කවුරු හරි කියනව නම් දත්ත දෙන්නෙ නැහැ කියලා. අපි සංගණන ආඥා පනතට පිටින් දෙන්නේ නැහැ. ඒ කියන්නේ පෞද්ගලික දත්තයක් ඉල්ලනවා නම් අපි දෙන්නේ නැහැ. සමහර කෙනෙක් ඉල්ලනවා මගේ ඉඩම මේ විධියට තියෙනවා. ඔබතුමියලගේ සංගණන සිදුකළා. ඒ නිසා මට මගේ ඉඩමේ පිහිටීම ගැන තොරතුරු ටික ලබා දෙන්න කියලා. අපි ඒක ලබා දෙන්නේ නැහැ. තමන්ට තමන්ගේම තොරතුරුවත් ගන්න බැහැ සංගණන ආඥා පනත යටතේ. ඒ විදිහට සංගණන අධිකාරී විදිහට වැඩ කරන අධ්‍යක්ෂ ජනරාල්වරියටවත් තොරතුරු ගන්න බැහැ.

**මවුබසින් තොරතුරු ලබා ගැනීම පුරවැසියන්ට තියෙන අයිතියක්. නමුත් දත්ත පිළිබඳ වාර්තා පරිශීලනයේදී බොහෝ දේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවතින්නේ. උදාහරණයක් විදිහට සංගණන හා සංඛ්‍යා ලේඛන ආඥා පනත පවා වෙබ් අඩවියේ දැක්වෙන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණයි?**

ඔව්, ඒක අපි පිළිගන්නවා. ඒක මං හිතන්නේ පැරැණි එකක්. ඒ කාලේ සකස් කර තියෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් විතරයි. නමුත් පසුකාලීන කරපු වෙනස්කම් අපි සිංහල භාෂාවෙන් ගැසට් නිවේදන ඇතුළත් කරලා තියෙනවා. අපේ ප්‍රකාශන ඉංග්‍රීසි භාෂාවෙන් විතරක් තියෙනවා කියන එකේ

සකල් ආනයනයට දුන් කාලය අවසන්!


සංගණන කොමසාරිස් විදිහට, ප්‍රාදේශීය ලේකම්වරු නියෝජ්‍ය සංගණන කොමසාරිස්වරු විදිහට පත්වෙනවා. අපේ දෙපාර්තමේන්තුව සංගණනයට තාක්ෂණ කටයුතු කරන අතරේ ප්‍රාදේශීය ලේකම්වරු ඒකේ පරිපාලන කටයුතු මෙහෙයවනවා. එතකොට අපිට ප්‍රාදේශීය පරිපාලනයේ සහයෝගය මේ තොරතුරු රැස් කිරීමට අත්‍යවශ්‍ය වෙනවා.

**දත්ත රැස් කිරීමේදී ඔබ දෙපාර්තමේන්තුව මුහුණදෙන අභියෝග මොනවාද? ඒ අභියෝග කාලය අනුව දැන් වෙනස් වෙලාද?**

අපි බොහෝ ගැටලුවලට මුහුණදුන්නා. ගණන් ගැනීමේ නිලධාරීන් බඳවා ගැනීමේදී ඇත්තටම ඒ ගැටලුව ආවේ ගොඩක්ම නාගරික ප්‍රදේශවල. දෙපාර්තුමේන්තුවේ ටැබ්ලට් පරිගණක ගණනාවක් තිබුණ නිසා අපිට රජයේ සේවකයන් අවශ්‍ය වුණා එතැනදී. මොකද අපි ටැබ්ලට් පරිගණක බාහිරින් බඳවා ගන්න අයට දුන්නේ නැහැ. බාහිරින් නිලධාරීන් ගත්තේ ඒ නිලධාරීන්ගේම ජංගම දුරකථනයෙන්ම තොරතුරු රැස් කරන්න. නිලධාරීන් බඳවා ගැනීමේදී ඉස්සර වගේ නෑ. ඉස්සර ගොඩක් දෙනෙක් මේක ගෞරවයක් විදිහට සැලකුවේ. නමුත් අද තත්ත්වය ඒ තරමටම නැහැ. ඊළඟට ප්‍රතිචාරකයන්ගේ පැත්තෙන් බැලුවොත් අද අපේ රටේ ජනතාව ගොඩක් කාර්යබහුල වෙලා තියෙනවා. නිවෙසකට තොරතුරු ලබාගන්න පැමිණෙන නිලධාරියකුට වෙන්කරන කාලයත් අද අපිට ගැටලුවක් වෙලා තියෙනවා. අද රටේ සිද්ධවෙන දේවලුත් එක්ක ජනතාව නිවෙස ඇතුළට අරගෙන ඒ නිලධාරීන්ට තොරතුරු ලබාදීමට යම් මැළිකමක් දක්වනවා. සමහර නිවාස ඒකකවල නිවාස වසා තැබීම කියන ගැටලුවට අපි තදින්ම මුහුණදීලා තියෙනවා. ඒ කියන්නේ ප්‍රදේශයකින් රැකියාවකට උදේම ගිහිල්ලා තිබුණොත් ඒ පුද්ගලයෝ ගෙදර යන්නේ රෑ වෙලා. එතකොට අපේ ගණන් ගැනීමේ නිලධාරීන් එනකොට

හදලා තියෙන්නෙම නොගැළපීම් තියෙනව නම් ප්‍රශ්නෙට

දෙන්න පුළුවන්. ගණන් ගන්නා නිලධාරියා ප්‍රශ්න අහන




**මවුබසින් තොරතුරු ලබා ගැනීම පුරවැසියන්ට තියෙන අයිතියක්. නමුත් දත්ත පිළිබඳ වාර්තා පරිශීලනයේදී බොහෝ දේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවතින්නේ. උදාහරණයක් විදිහට සංගණන හා සංඛ්‍යා ලේඛන ආශ්‍රිත පනත පවා වෙබ් අඩවියේ දැක්වෙන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණයි?**

ඔව්, ඒක අපි පිළිගන්නවා. ඒක මං හිතන්නේ පැරැණි එකක්. ඒ කාලේ සකස් කර තියෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් විතරයි. නමුත් පසුකාලීන කරපු වෙනස්කම් අපි සිංහල භාෂාවෙන් ගැසට් නිවේදන ඇතුළත් කරලා තියෙනවා. අපේ ප්‍රකාශන ඉංග්‍රීසි භාෂාවෙන් විතරක් තියෙනවා කියන එකේ ගැටලුවක් තියෙනවා. ඇත්තටම වෙලා තියෙන්නේ අපිට ඒ භාෂා තුනෙන්ම හදන්න භාෂා පරිවර්තකයන් නැති ගැටලුව තමයි.

**දත්ත සන්නිවේදන ජනමාධ්‍ය ප්‍රධාන භූමිකාවක්. ඒක නිවැරැදිව වෙනවා කියලා ඔබ හිතනවද?**

මාධ්‍ය නිවේදන වාර්තා පැහැදිලි නැත්නම් අපිත් එක්ක කතා කරන්න පුළුවන්. උදාහරණයකට ආර්ථික අර්බුද කාලයේ උද්ධමනය අඩුවෙලා යැයි මාධ්‍ය පුවතක් වාර්තා කළා. එතකොට ඒ පුවතත් එක්කම ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නෝනලා බඩු ගන්න කඩේ අහන්න ඕනි කියලා කිව්වා. ඇත්තටම උද්ධමනය කියන්නේ බඩු මිල අඩු වීම නෙවෙයි. බඩු මිල වැඩි වීමේ වේගය අඩු වීමයි. හුඟක් වෙලාවට වෙන්නේ ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විවේචන වෙන එකනේ. වැරැද්දක් තියෙනව නම් ඇයි මේක මෙහෙම වුණේ කියලා අපෙන් අහනවා නම් අපිට පැහැදිලි කරන්න පුළුවන්.

සංලාපය: රවිශාන් ප්‍රනාන්දු

● ඡායාරූපය : මංජුල දයාවංශ